යටියන්තොට ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති වලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති අංක 01 හි 21 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළයුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

1. මුදල් ප්‍රවාහ ප්‍රකාශන
11. ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය
111. අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර සංසන්දනාත්මක ප්‍රකාශය

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ අවසානයට පැවති වත්කම් හා බැරකම් ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ගිණුම්ගත කිරීමට අදාල ජ්නල් සටහන් ඉදිරිපත් කර නොතිබුණ අතර, ගිණුම් ගැලපීමට අදාල ජ්නල් සටහන්වල හර හා බැර සටහන් අසම්පූර්ණ ලෙස දක්වා තිබූ අවස්ථා සහ සටහන් කිහිපයක සංලක්ෂය අසම්පූර්ණ ලෙස දක්වා තිබුණි.

(ආ) වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර 2013 දෙසැම්බර් 31 දිනට පැවති රු. 4,006,500 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත විය යුතු රු. 104,150 ක අයිතමයන් 10 ක් ,යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ගිණුමට ඇතුළත් කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව භෞතිකව නොපවතින රු. 910,800 ක් වූ ගොඩනැගිලි වත්කම් 13 ක් මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ අවසානයට සේවක ණය ගිණුමේ ශේෂය රු. 3,413,892 ක් වුවද, එය සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු. 4,092,914 ක් වශයෙන් ඉදිරියට ගෙනවිත් තිබූ නිසා සේවක ණය ගිණුම රු. 679,022 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ ශේෂ පත්‍රය අනුව වත්කම් හා බැරකම් ශේෂ අතර රු. 380,303 ක වෙනසක් පැවති අතර ඒ අනුව ප්‍රාග්ධන යෙදවුමට වඩා ශුද්ධ වත්කම් වටිනාකම ඊට සමානව වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, පෞද්ගලික මාධ්‍ය ආයතනයකට ගෙවිය යුතුව තිබූ රු. 59,119 ක් ගිණුම් වලට ගෙන නොතිබුණි.

1.3.3 නොසැසඳුන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 09 කට අදාල පාලන ගිණුම් / උපයෝගි ලේඛන වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු. 134,548,837 ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 164,750,087 ක් වූයෙන් රු. 30,434,006 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ 2012 මැයි 29 දිනැති අංක 3/2012 දරන චක්‍රලේඛය | ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබූ අක්කර 20 ½ ක් වූහෙක්ටයාරයට වැඩි ඉඩම් 06 කින් එක් එක් ඉඩම් ප්‍රමාණයෙන් 10% ක භූමි භාගයක් සභාව මඟින් පවරාගත යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. |
| (ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158 (1) (අ) වගන්තිය | දීර්ඝ කාලයක සිට පැවත එන රු. 201,598 ක වරිපනම් බදු මුදල් නොගෙවන ලද බදුකරුවන් 15 දෙනෙකු සම්බන්ධව විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |

02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,499,218 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,257,385 ක් විය.

2.2 මූල්‍ය ප්‍රතිඵල විග්‍රහාත්මක සමාලෝචනය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 241,833 ක වර්ධනයක් පෙන්නුම් කෙරෙන අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් පුනරාවර්ථන වියදම්හි ඇතුළත් වැටුප් හා දීමනා රු. 1,250,561 කින් අඩුවීම බලපා තිබුණි.

2.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

බෙලිලෙන සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ගිමන්හල ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු. 262,142 ක මුදලක් 2011 අගෝස්තු 05 දින කිරිකොහුතැන්න සුළු ගොවි සංවිධානයට ගෙවා තිබුණද, විගණිත දිනය වූ 2013 ඔක්තෝබර් 17 දක්වා කර්මාන්තයේ වැඩ නිමකර නොතිබුණි. එකී අත්තිකාරම් මුදල පියවීමට කටයුතු කර නොතිබුණි. මෙම තත්වය යටතේ එම සංවිධානය අසාධුලේඛන ගත කිරීමට පියවර ගත යුතුව තිබුණද, එසේ කටයුතු නොකර වෙනත් කර්මාන්ත ඉදිකිරීම් කොන්ත්‍රාත් දිගින් දිගටම ඉටුකරවා ගැනීමට කටයුතු කර තිබුණි.

2.4 <u>නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්</u>

සභාව සතු වාහන 06 ක් ප්‍රයෝජනයට නොගෙන ධාවනයෙන් ඉවත් කර ගාල් කර තිබුණු අතර එම වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ ඒවා සම්බන්ධව වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5 <u>අභ්‍යන්තර විගණනය</u>

1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

03. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) වාහන පාලනය